www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආන්ඩුවට එරෙහිව උද්ඝෝෂනය කල ගොවීන්ට ශ්‍රී ලංකා පොලීසිය නඩු පවරයි

## Sri Lankan police charge farmers over anti-government protest

**නිහාල් ප්‍රනාන්දු සහ ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2007 ජූලි 25**

දැදුරු ඔය ජල යෝජනා ක්‍රමයට අදාලව දෙන ලද පොරොන්දු බිඳ දැමීම සම්බන්ධයෙන් ඇමතිවරයෙකු හා ගොවීන් අතර මුහුනට මුහුන ලා ඇතිවූ ගැටුමකින් පසුව මාසයකට අධික කාලයක් රිමාන්ඩ් බන්ධනාගාර ගත කර සිටි ගොවීන් 21 දෙනෙකු පසු ගිය අඟහරුවාදා (17) මහේස්ත්‍රාත් උසාවිය විසින් ඇප පිට නිදහස් කරන ලදී. නීති විරෝධී ජන රාශිය, ආන්ඩුවේ දේපොලවලට හානි කිරීම සහ පොලිස් නිලධාරීන්ට පහර දීම ඇතුලු චෝදනා පහක් මත ගොවීන්ට විරුද්ධව නඩු පවරන බව පොලීසිය උසාවියට දන්වා සිටියේ ය.

වාරිමාර්ග, වරාය සහ නාවික ඇමති චමල් රාජපක්ෂ ජූලි 11 උතුරු මැද පලාතේ වේරහැරයාගම ප්‍රදේශයේ කල සංචාරයක දී විරෝධතාවයක යෙදී සිටි 2000කට අධික ගොවීන්ගේ කෝපය ඉහවහා ගියේ ය. අලුත් ජල යෝජනා ක්‍රමයකට ඉඩ ලබා ගැනීම සඳහා පදිංචි ස්ථානවලින් ඉවත් කිරීමේ ආන්ඩුවේ සැලැස්මට සහ දුරබැහැර කරුවලගස්වැව ප්‍රදේශයෙන් ලබා දී ඇති ඉඩම් සඳහා නිවාස, ජලය සහ විදුලිය ඇතුලු මූලික පහසුකම් පවා නැතිකමට උද්ඝෝෂකයෝ විරෝධය පාමින් සිටියහ.

සුදුසු පහසුකම් සැපයීම සම්බන්ධව ලිඛිත පොරොන්දුවක් ගොවීන් ඉල්ලා සිටි විට "ඔයාලට මාලිගා හදලා දෙන්න අපිට පුලුවන් කමක් නැතැයි" රාජපක්ෂ ප්‍රකාශ කලේ ය. තම ප්‍රකාශය නිසා ගොවීන්ගේ කෝපාවිෂ්ට විරුද්ධත්වයට මුහුන දීමත් සමග ඔහුගේ ආරක්ෂකයන්ගේ රැකවරනය ඇතිව ඇමතිවරයා සහ ඔහුගේ පරිවාර නිලධාරීහු ක්ෂනිකව පසුබැස පලා ගියහ. එදින ම රාත්‍රියෙහි ගොවීන් 17 අත් අඩංගුවට ගත් පොලීසිය ජූලි 19 වාරියපොල උසාවියෙන් පිටත රැස්ව සිටි ගොවීන් අතරින් තවත් 4ක් අත් අඩංගුවට ගත්තේ ය. අත් අඩංගුවේ සිටි ගොවීන් පසුගිය සතියේ සියලු චෝදනාවලට තමන් නිවැරදිකරුවන් බව ප්‍රකාශ කල අතර රුපියල් 25,000 බැගින් වූ පුද්ගලික ඇප මත උසාවිය ඔවුන්ව නිදහස් කලේ ය. ජල යෝජනා ක්‍රමයට විරුද්ධව කිසිදු ක්‍රියාවක නොයෙදෙන ලෙස චූදිතයන්ට අවවාද කල මහේස්ත්‍රාත්වරයා ඊලඟ නඩු දිනය සැප්තැම්බර් 11 නියම කලේ ය.

ප්‍රදේශයේ ගොවීන් සහ පලල් ජනතාව සමීපව ඇස ගසා ගෙන සිටි මෙම ප්‍රශ්නය යට ගැසීමේ උත්සාහයක ප්‍රදේශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (ශ්‍රීලනිප) නායකයෝ නිරත වූහ. ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ සොහොයුරු චමල් රාජපක්ෂ යන දෙදෙනාම අයත් ශ්‍රීලනිපය පාලක හවුල් ආන්ඩුවේ විශාලතම පක්ෂය යි. ගැමි ප්‍රදේශවල සහයෝගය මත රැඳී සිටින ශ්‍රීලනිපය ඉහල යන බඩු මිල, ගැමි සහනාධාර කැපීම, මූලික සේවාවන් ප්‍රමානවත් ලෙස නැතිකම සහ දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහි යලි ආරම්භ කර ඇති යුද්ධය නිසා දැනට මත් දැඩි විවේචනයට ලක්ව ඇත.

වාරියපොල ප්‍රාදේශීය සභාවේ සභාපති ඩී.බී. හේරත් ජූලි 11 දැදුරු ඔය ව්‍යාපෘතියෙන් අවතැන් වන්නන්ගේ සංගමයේ නියෝජිත පිරිසක් ජනාධිපති රාජපක්ෂ හමුවීමට කැඳවාගෙන ගියේ ය. දැදුරු ඔය ව්‍යාපෘතියෙන් අවතැන්වන්නන්ගේ සංගමයේ ලේකම් එච්.එම්. සෙනෙවිරත්න බංඩා, පැවසූ ආකාරයට රාජ්‍ය දේපලවලට හානි කිරීම සම්බන්ධ චෝදනාව ඉවත් කිරීම ගැන "සලකා බලන" බවට ජනාධිපති පොරොන්දු විය. අහිමිවන දේපලවලට අවුරුද්දක් ඇතුලත වන්දි ලබා දීමට වාරියපොල ප්‍රදේශයෙන් අක්කර භාගයක් ලබා දීමට සහ කරුවලගස්වැව ප්‍රදේශයේ පදිංචි කර සිටින අයට විදුලිය, ජලය, සෞඛ්‍ය සහ ප්‍රවාහන පහසුකම් සැපයීමට ද ඔහු පොරොන්දු විය. කෙසේ නමුත් ඊට ඉහත දී වාරිමාර්ග ඇමතිවරයා දුන් පොරොන්දුවලට වඩා මෙම පොරොන්දුවල වෙනසක් නැත. එමෙන්ම රාජ්‍ය වාහනවලට සිදු වූ රුපියල් 149,175 අලාභය ගොවීන් විසින් ගෙවිය යුතු බව ප්‍රදේශයේ ශ්‍රීලනිප නායකයෝ කීහ. නීති ගාස්තුවලට අමතරව දැරිය යුතු මෙම මුදල දුගී ගොවීන්ට විශාල ගනනක් වුනත් අත් අඩංගුවට ගත් පවුල්වල අය එම මුදල එකතු කලහ. ආන්ඩුවේ වාහනවලට අලාභහානි කිරීම පිලිබඳ චෝදනාව ඉවත් කිරීමට පොලීසිය එකඟ විය යුතු ය.

ගොවීන්ට එරෙහිව නගා ඇති චෝදනා සැලකිය යුතු විරුද්ධත්වයක් නිර්මානය කර තිබේ. එක්සත් සමාජවාදී පක්ෂය (එසප), දියැස අධ්‍යයන කවය සහ ලංකා ගුරු සංගමය (ලංගුස) දදුරු ඔය ව්‍යාපෘතියෙන් අවතැන් වන්නන්ගේ සංගමය සමග එක්ව ජූලි 1 වාරියපොල පොතුවැව දී රැස්වීමක් පැවැත්වූහ.

ආන්ඩුවේ ක්‍රියාවන් සම්බන්ධව පැහැදිලි කිරීමක් නොකල කථිකයෝ ඒ වෙනුවට විශාල විරෝධතා මගින් රාජපක්ෂ මත පීඩනය යෙදිය හැකි බවට මිථ්‍යාවන් වගා කලහ. එසප නායක සිරිතුංග ජයසූරිය උද්ඝෝෂනය ගමට සීමා නොකර නගරයට ගෙන එන්නැයි වාචාල ලෙස ඉල්ලා සිටියේ ය. "අපේ ධෛර්යය සහ ශක්තිය ඒකරාශී කරලා අත් අඩංගුවේ ඉන්න ගොවීන් අපි නිදහස් කර ගමු. රටේ ජනතාවගේ ආශීර්වාදය ඇතිව අරගලය ජයග්‍රහනය දක්වා අපි පෙරට යමු" යි ඔහු ප්‍රකාශ කලේ ය..

දදුරු ඔය ව්‍යාපෘතිය මගින් අවතැන් වන ගොවීන් සඳහා ප්‍රමානවත් තරම් පහසුකම් සැපයීමට අසමත් වීම දිවයින පුරාම මහජනතාවගේ ජීවන තත්වයන් මත එල්ල කරන ආන්ඩුවේ පුලුල් ප්‍රහාරවල කොටසකි. එල්ටීටීඊය මිලිටරිමය වසයෙන් තලා දැමීමේ වාර්ගික යුද්ධයට රුපියල් බිලියන ගනන් වැය කරන ජනාධිපති රාජපක්ෂ බඩු මිල ඉහල දැමීම සහ සංවර්ධන ව්‍යාපෘති සහ අත්‍යවශ්‍ය සේවාවන් ඇතුලු මහජන වියදම් කැපීම මගින් යුද්ධයේ බර වැඩ කරන ජනයා මත පටවා ඇත.

පොතුවැව රැස්වීමේදී එකම කථිකයෙක් වත් යුද්ධය ගැන හෝ කම්කරුවන් සහ ගොවීන් කෙරෙහි එමගින් ඇති කරන ආදීනව ගැන සඳහනක් වත් නො කලේ ය. වාරිමාර්ග ඇමතිගේ උද්ධච්ච කථා සහ ඊට පසුව සිදු කෙරුන උද්ඝෝෂකයන් අත් අඩංගුවට ගැනීම ආන්ඩුවේ ප්‍රතිපත්තිවලට එරෙහි යන කවර හෝ විරුද්ධත්වයක් සම්බන්ධව ගනුදෙනු කිරීමේ මර්දනකාරී ක්‍රම පිලිබඳව තවත් එක් උදාහරනයකි. "වම්මුන් ලෙස මවා පෑම් කරන අතරම එසප සහ සෙසු රැඩිකල් කන්ඩායම් යුද්ධය අවසන් කිරීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කිරීමේ සහ යහපත් ජීවන තත්වයක් සඳහා අරගලයකට සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම් වූ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට විරුද්ධ වෙති.

ශ්‍රීලනිප නියෝජිත කන්ඩායම ජූලි 11 ජනාධිපති හමුවීම කෙරෙහි ඔවුන්ගේ ප්‍රතිචාරය මගින් ශ්‍රීලනිපයට සහ ආන්ඩුවට මෙම රැඩිකල් කන්ඩායම්වල ඇති සම්බන්ධතාවය ක්ෂනිකව ම එලිදරව්විය. මෙම හමුවෙන් පසුව රාජපක්ෂ දුන් පොරොන්දු හොඳ අවස්ථාවක් ලෙස ඩැහැ ගත් එසප, දියස අධ්‍යයන කවය සහ ලංකා ගුරු සංගමය පසු දින කොලඹදී පැවැත්වීමට සැලසුම් කර තිබූ පිකට් උද්ඝෝෂනය නතර කලහ.

"දදුරු ඔය ගොවීන්ගේ අරගලයේ ඊලඟ පියවර ගැන අපි සුපරික්ෂාකාරීව අවධානයෙන් සිටින්නෙමු" යි ඔවුහු පත්‍රිකාවක් නිකුත් කරමින් කියා සිටියහ. ජනාධිපතිගේ සහ ආන්ඩුවේ බොරු පොරොන්දුවලට එසපය විසින් විශ්වාසනීයත්වයක් ලබා දී ඇත. ගොවීන් 21 දෙනාට එරෙහි චෝදනා එලෙස පවතී. අවතැන් වන්නන්ට වන්දි ගෙවීම, ආධාර උපකාර කිරීමේ සහ හොඳ සේවාවක් ලබාදීමේ පොරොන්දු ඉදිරියේ දී ඉටු කෙරෙන තුරු බලා සිටිය යුතු ය. ආන්ඩුවේ අංක එකේ ප්‍රමුඛත්වය ලැබෙන්නේ කම්කරුවන් සහ ගොවීන් විසින් පරිත්‍යාගයන් කල යුතු යැයි එය විසින් ඉල්ලා සිටින විනාශකාරී සහ ප්‍රතිගාමී යුද්ධයට ය.

දිවුල්ගස්පිටිගම, නාගොල්ලාගම, වල්පාලුව සහ කැකුලාවල අත් අඩංගුවට ගත් ගොවීන් ගේ ඥාතීන් කිහිප දෙනෙකු සමග *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* වාර්තාකරුවෝ කතා කලහ.

ඔහුගේ දරුවන් දෙදෙනෙකු පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන රැඳවුම් බාරයේ තබා ඇති බව ඩී.එම්. පොඩිබන්ඩා විස්තර කලේ ය. ඩී.එම්. සරත් කුමාර සහ ඩී.එම්. අනිල් කුමාර යන දෙදෙනාම ඒ වන විට අත් අඩංගුවේ පසුවූහ.

"මගේ සමන් කුමාර පුතා ආබාධිත සෙබලෙක්. ජූලි 11 විරෝධතා උද්ඝෝෂනයට ඔහු සම්බන්ධ වුනේ නැහැ. මහ රෑ 2ට පමන පොලීසියෙන් ආවා. ඔහු අත් අඩංගුවට නොගෙන මායි මගේ අනෙක් පුතයි අත් අඩංගුවට ගන්න කියලා මම බැගෑපත් වුනා. නමුත් ඔවුන් ඇහුම් කන් දුන්නේ නැහැ."

1999 වසරේ මන්නාරමේදී සටන් කරමින් සිටිය දී ඔහුගේ පුතා තුවාල වී හමුදා රෝහලේ මාස තුනක් නේවාසික ප්‍රතිකාර ගත් බව පොඩිබන්ඩා පැවසුවේ ය. ඔහුට එම කාලයට මාසයකට රුපියල් 3,000ක් පමනක් ගෙවා ඇති අතර ඉන් පසුව ඔහු හමුදා ඇඳුම් මහන කර්මාන්ත ශාලාවකට අනුයුක්ත කර ඇත. තුවාල හොඳින් සුව වී නොතිබූ අතර ඔහුගේ කකුල නැවතත් ශල්‍යකර්මයකට භාජනය කිරීමට සිදුවිය. ඉන් පසු එම පාදය පන නැති වීම නිසා දැන් ඔහු ඇවිදින්නේ ඉතා අපහසුවෙනි.

"ඔහු හමුදාවේ සේවය කරද්දී අපේ පවුල යැපුනෙ ඔහුගෙන්" පොඩිබංඩා පැවසුවේ ය. "ඔහුට වැඩ කිරීමට නොහැකි වූ විට හමුදාවෙන් පඩි ගෙවීම නතර කලා. දැන් ඔහු ජීවත් වෙන්නේ ඔයෙන් වැලි ගොඩදාලා විකුනලා. එයාගෙ දුවගෙ වයස අවුරුදු 10යි. ඇය ඉන්නෙ හරිම දුකෙන්.

වෙනත් රැකියාවක් නැති නිසා දුප්පත් තරුනයො හමුදාවට බැඳෙනවා. ඔවුන් මැරෙනවා. දුක්

පීඩා විඳින්නෙ දුප්පතුන්. ප්‍රභුවරු ඔවුන්ගෙ දරුවො යුද්දෙට යවන්නෙ නැහැ. යුද්ධයේ බර ආන්ඩුව අපේ පිට පටවනවා. යුද්ධයට පනවපු නීති අපට විරුද්ධව පාවිච්චි කරනවා."

අනිල් කුමාර අත් අඩංගුවට ගත් පසු ආරක්ෂාවක් නැති නිසා ඔහුගේ බිරිඳ කරුවලගස්වැවේ සිට ආපසු ගමට පැමිනියා ය. රාත්‍රී කාලයෙහි වල් අලි එහි සැරිසරති. "බීමට සහ නෑමට ප්‍රමානවත් ජලය අපට ලැබෙන්නේ නැහැ. කුඹුරුවලට වතුර දෙන්නෙ දවස් 15ට වරක්. නාන්න, රෙදි සෝදන්න අප පාවිච්චි කරන්නෙ ඒ වතුර. මේ නිසා මගේ අතදරුවාට සමේ රෝගයක් වැලඳුනා." ඇය පැවසී ය.

අත් අඩංගුවට ගැනීමට එරෙහිව විරෝධය පෑමට පැමින උසාවිය අසලට රැස්ව සිටි අවස්ථාවේ දී ලියුකේමියා රෝගියෙකු වන නාමල් සමරදිවාකර පොලීසිය විසින් අත් අඩංගුවට ගත්තේ ය. බිරිඳ චන්ද්‍රලතා ඔහුගේ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කල නමුත් පසු දින වනතුරු පොලීසිය ඔහුව නිදහස් කලේ නැත. "අපට දරුවො දෙන්නෙක් ඉන්නවා. දුවෙකුයි, පුතෙකුයි. කරුවලගස්වැවෙන් දුන්න ඉඩම් අපට වගා කරන්න බැහැ. එදිනෙදා කුලී වැඩක් කරලයි මෙහෙදි අපේ ජීවිකාව අප ගෙනියන්නේ. මා නිකවැරටියෙන් ඉඩම් ඉල්ලුවා. නමුත් නිලධාරින්ගෙන් තවම උත්තරයක් ලැබුනෙ නැහැ. ඇය පැවසී ය.

එකොලොස් වියැති ඇගේ පුතා, සම්පත් ප්‍රියන්ත සමරදිවාකර පවුලේ ජීවිකාවට උදව් කිරීම සඳහා කුලී වැඩ කරයි. "ඉස්කෝලේ ඇරිලා ඇවිල්ලා මා වැලි ගොඩ දානවා. වැලි කියුබ් එකක් ගොඩ දාන්න මට දින පහක් ගත වෙනවා. බලපත්‍ර අයිතිකාරයෝ වැලි කියුබ් එකකට ගෙවන්නෙ රුපියල් 1000යි. සමහර දවස්වලට මා ගඩොල් කපනවා, නැත්නම් ගඩොල්වලට මැටි පාගනවා. ගලක් කපලා වේලලා දුන්නම අපට ගෙවන්නෙ රුපියල් දෙකයි. මැටි පාගන එක හරිම අමාරුයි. සමහර මැටි වලවල් හරි ගැඹුරුයි. දවසකට අප පස්දෙනෙකුට කපන්න පුලුවන් ගඩොල් 1,500යි. සෙනසුරාදා-ඉරිදා දවස්වලට රෑ 7 වෙනකම් අප වැඩ කරනවා. මගේ යාලුවො බොහෝ දෙනෙක් පවුලට උදව් කරන්න මේ රස්සාව කරනවා." ඔහු පැවසුවේ ය.

අත් අඩංගුවට ගත් අය අතර ඇගේ පුතා සුගත් රෝහන සහ බෑනා නිහාල් ප්‍රදීප් කුමාර සිටින බව ඩබ්ලිව්. ලිලියන් නෝනා පැවසීය.

"අප බලාපොරොත්තු වෙන තරම් ඉක්මනට අපේ ලමයින් නිදහස් කර ගන්න බැහැ. කියලා නීතිඥ මහත්තුරු කියනවා. ලොකු නීතිඥ ගාස්තුවක් අප ගෙවන්න ඕනැ. මගේ පුතා කිව්ව එච්චර මුදලක් ගෙවන්න එපා කියලා. ඒ වුනත් මට දුකයි. රිමාන්ඩ් එකේ දී ඒගොල්ලන්ට හරි කරදරයි. නාන්න, රෙදි සෝදන්න ප්‍රමානවත් තරම් වතුර ලැබෙන්නෙ නැතිලු. රිමාන්ඩ් එකේදි ඔවුන්ට සලකන්නේ වනසතුන්ට වගේ "

යුද්ධය පිලිබඳව ලිලියන් නෝනා ඇගේ අප්‍රසාදය ප්‍රකාශ කලා ය. "ඒක දේශපාලකයන්ගේ වැඩක්: යුද්දෙන් මිනිස්සු මැරෙනවා අවතැන් වෙනවා. බලහත්කාරයෙන් ඉවත් කිරීම නිසා මාර්තු 22 අප අවතැන් වුනා. අප පන්සල්වලට ඔලුව උඩ තියාගෙන දානෙ ගිහිල්ල දෙනවා. යුද්ධයට කැගහන එක හාමුදුරුකෙනෙක් වත් අපේ ප්‍රශ්න ගැන කතා කරන්නෙ නැහැ." ඇය පැවසීය.

ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබා දුන්නා නම් ගැටුමක් ඇති නොවන බව 65 වියැති ජේ.එම්. හේරත්බංඩා පැවසුවේ ය.

"මා පවුලේ අයත් එක්ක දිවුලගස්පිටිගම ආවේ 1960. මගේ අත්දැකීම, හැම ආන්ඩුවක් යටතෙම ගොවියො තව තවත් දුප්පත් වුනා. ජීවන වියදම ඉහල නැගීමත් එක්ක ගොවීන්ට වගාකරන්නවත්, ජීවත්වෙන්නවත් බැහැ. ගොවීන්ගෙ ප්‍රශ්න විසඳනවා කියලා ජනතා විමුක්ති පෙරමුන කයිවාරු ගැහැව්ව. නමුත් ඔවුන් ආන්ඩුවේ ඉඳිද්දී (2004-2005) ගොවීන්ට කිසිම යහපතක් වුනේ නැහැ.

"ලඟදී තෙල් මිල ඉහල යාම නිසා අප තවත් අමාරුවට වැටුනා. ආන්ඩුවට අපේ අස්වැන්න මිලට ගැනීමේ ක්‍රමවත් සැලැස්මක් නැති නිසා පුද්ගලික වෙලෙන්දෝ ඒකෙන් වාසි ගන්නවා. ඒ නිසා ආන්ඩුවේ මිල රුපියල් 16ක් වුනත් පුද්ගලික වෙලෙන්දන්ට රුපියල් 9ට හෝ 12ට වී කිලෝව විකුනන්න අපට සිද්ධවෙනවා. කෙලවරක් නැති යුද්ධය රට තවතවත් ප්‍රපාතයට ඇදගෙන යනවා. දේශපාලනඥයෝ සියලු වරප්‍රසාද බුක්ති විඳින ගමන් යුද්ධෙ සම්පූර්න බර අපේ උඩට දානවා."

© www.wsws.org